හිතවත් ගනුදෙනුකාර හවතුනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ගනුදෙනුකරුවන්ගේ ප්‍රඥප්තිය යටතේ වන අවශ්‍යතාවයක් අනුව, අප විසින් සපයනු ලබන බැංකු සේවා වලින් ඔබට අවශ්‍ය සහ අදාළ වන සේවා තෝරා ගැනීම සඳහා සහය වීමට මෙම 'මූලික විස්තර පත්‍රිකාව' නමැති ප්‍රකාශන මාලාව අප විසින් පිළියෙල කරනු ලැබ ඇත.

පෞද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව මගින් පිරිනැමෙන විවිධ මාදිලියේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සමග ගිණුම් වලට අදාළ විශේෂ පැකේජයන් විදේශ ව්‍යවහාර මුදල් පෞද්ගලික ගිණුම් පිළිබඳ පුළුල් විස්තරයක් මෙම මූලික විස්තර පත්‍රිකාව මගින් ඔබ වෙත ඉදිරිපත් කෙරේ.

කෙසේ වුවද නීතිමය හා පාලන වෙනස්කම් අනුව සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටීන්හි සිදුවන වෙනස්කම් අනුව මෙම මූලික විස්තර පත්‍රිකාවෙන් ඇතුළත් කරුණු ප්‍රතිශෝධනය විය හැකි බව කරුණාවෙන් සළකන්න.

මේ පිළිබඳ වැඩිදුර විස්තර දැනගැනීමට ඔබට අවශ්‍ය නම් කරුණාකර www.nationstrust.com වෙබ් අඩවිය වෙත පිවිස හෝ 011 4 711 411 ඔස්සේ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය අමතා අප හා සම්බන්ධ වන්න.

පහතින් දක්වා ඇති ගිණුම් වලින් ඔබේ ගිණුමකට අදාළව යම් පැමිණිල්ලක් සිදුකිරීමට ඇති නම් කරුණාකර කෙටියෙන් ලියන ලද පැමිණිල්ල ඇතුළත් ලිඛිත ප්‍රකාශයක් පැමිණිලි විසඳීම් නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, නො. 242, යුනියන් පෙදෙස, කොළඹ 02. වෙත ඉදිරිපත් කරන්න. නැතහොත් **[+94(0)11 4711411]**ඔස්සේ අප අමතන්න. ඊ මේල් **[customerservice@nationstrust.com]** එයට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට අපි බැඳී සිටින්නෙමු.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, පීකිව් 118, නො. 242, යුනියන් පෙදෙස, කොළඹ 02.

| ගිණුම පිළිබඳ විස්තරය | ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ | ගාස්තු වර්ග සහ වෙනත් බැංකු අය කිරීම් | ගිණුම විවෘත කිරීම සඳහා අනුගමය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| **අ) ඉතිරි කිරීමේ ගිණුම්** | | | | |
| **නේෂන්ස් මැක්ස් බෝනස් ඉතුරුම් ගිණුම**<br><br>මෙය පොළිය ලැබෙන ගිණුමකි මෙම ගිණුම මගින් ගිණුමෙහි පවත්වා ගෙන යනු ලබන ශේෂය මත බෝනස් පොළියක් ලබාදෙමින් ප්‍රතිලාභ සලසනු ලැබේ | * වසරකට 2.5 % ක පොළී අනුපාතය<br><br>*රු.100000/- නොමිලේ ජීවිතාවරනය.<br><br>*රු.25000/- දක්වා නොමිලේ බරපතල රෝගාබාධ රක්ෂණය.<br><br>* ඉතුරුම් ශේෂය මත බැංකු අයිරා පහසුකම<br><br>* පොළී බැර වීම් සහ බෝනස් පොළී පිළිබඳ විශේෂ කෙටි පණිවුඩ<br><br>* මෙම ගිණුම සඳහා ප්‍රකාශනයන් කාර්තුමය පදනමක් මත නිකුත් කරනු ලැබේ.<br><br>* අන්තර්ජාල බැංකුකරණ ජංගම දුරකථන බැංකුකරණ සහ SMS බැංකුකරණ පහසුකම්.<br><br>* හර කාඩ්පත් පහසුකම. | * ගනුදෙනුකරුවාගේ ගිණුමෙහි ශේෂය රු 1000/- ට වඩා පහත වැටුනහොත් රු50/- ක ගාස්තුවක් අය කෙරේ.<br><br>* ගිණුම වසා දැමීමේ ගාස්තුව.<br><br>* හර කාඩ්පත් වාර්ෂික ගාස්තුව සහ සියළුම සම්මත ගනුදෙනු ගාස්තු. | බැංකුවේ ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේ සාමාන්‍ය අයදුම් පත්‍රය පුරවා පහත දැක්වෙන ලේඛණද සමග බැංකු ශාඛාවක් වෙත ඉදිරිපත් කළ යුතුය.<br><br>* ජාතික හැඳුනුම්පතෙහි/වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි පිටපතක්.<br><br>* ජාතික හැඳුනුම්පතෙහි හෝ විදේශ ගමන් බලපත්‍රයෙහි ඇති නේවාසික ලිපිනයට වඩා වෙනස් ලිපිනයක් අයදුම්පතෙහි සඳහන් කරන්නේ නම් එම ලිපිනය සනාථ කිරීමට ලේඛණගත සාක්ෂියක්. | * සුදුසුකම් ලත් තැනැත්තන්<br><br>ජාතික හැඳුනුම්පතක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් සහිත අවුරුදු 18 ට වැඩි නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්.<br><br>* අවම ආරම්භක තැන්පතුව රුපියල් 10000/- ක් වේ.<br><br>* කාලානුරූපව බැංකුව මගින් නිගමනය කරනු ලබන පොළී අනුපාත අනුව සාමාන්‍ය සහ බෝනස් පොළිය උපචිත වේ.<br><br>* වෙනත් තැන්පතු සැලසුම් හා සමානම රඳවා ගැනීමේ බද්ද අදාළ වේ.<br><br>* බෝනස් පොළිය සඳහා සුදුසුකම් ලැබීමට ගනුදෙනුකරු විසින් මසකට එක් මුදල් ආපහු ගැනීමක් පමණක් සිදුකිරීම හෝ කිසිදු මුදල් ආපසු ගැනීමක් සිදු නොකිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ▪ රක්ෂණ පහසුකම සඳහා රු.10,000ක අවම තැන්පතුවක් අවශ්‍ය වේ.<br>▪ රක්ෂණ පහසුකම ලබාගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි සමග ඔබගේ ආසන්නතම ශාඛාව සම්බන්ධ කරගත යුතුය.<br>▪ වයස අවුරුදු 70 දක්වා ජීවිත රක්ෂණාවරණය වලංගු වන අතර, වයස අවුරුදු 60 දක්වා බරපතල රෝගාබාධ රක්ෂණාවරණය වලංගු වේ. |